# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 43 — 1973 ජනවාරි 19 වැනි සිකුරාද — 1973.01.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම භාෂාවකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම | 71 | ආණ්ඩුවේ නොවන දැන්වීම | 78 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම | 76 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| මුඩු මාහිරාදිය විකිණීම | 76 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම | — |
| කොටුපල් වරෙන්ද හා වෙනත් වරෙන්ද විකිණීම | 78 | විවිධ දැන්වීම | 79 |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| (1) මෙරට සාදන ලද කැරම් ලෑලි සහ දාම් ලෑලි සැපයීම | 1973.2.8 |
| (2) මෙරට සාදන ලද විශේෂ ලියුම් කවර සැපයීම | 1973.2.8 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ජනවාරි 19 දින,
කොළඹ දී ය.

1–709—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කවර හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල් ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය

පහත සඳහන් කාලසීමාවන් තුළ දියතලාවේ පැවැත්වෙන ලංකා ශිෂ්‍ය භට බලකායේ වාර්ෂික පුහුණුකිරීමේ කඳවුරුවලට සහභාගිවන නිලධාරීන් සහ ශිෂ්‍ය භටයින්ට අවශ්‍ය සියලු ආහාර පානාදිය සැපයීම සඳහා 1973 පෙබරවාරි මස 06 වන දින පෙරවරු 10 දක්වා කොළඹ බාලදක්ෂ මාවතේ, යුද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

1973.03.01 සිට 1973.03.05
1973.03.05 සිට 1973.03.09
1973.03.10 සිට 1973.03.14
1973.03.14 සිට 1973.03.18
1973.03.19 සිට 1973.03.23
1973.03.23 සිට 1973.03.27
1973.03.28 සිට 1973.04.01
1973.04.01 සිට 1973.04.05
1973.04.06 සිට 1973.04.10
1973.04.16 සිට 1973.04.30
1973.08.01 සිට 1973.08.10
1973.08.13 සිට 1973.08.22
1973.08.25 සිට 1973.09.03
1973.09.06 සිට 1973.09.15
1973.09.18 සිට 1973.09.27

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා යුධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉහත සඳහන් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රුපියල් 75 ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුයි.

ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට, පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර්පත් 1973 ජනවාරි මස 31 වෙනි දින පෙරවරු 10 දක්වා ලංකා ශිෂ්‍ය භට බලකායේ සේනාවිධායක විසින් නිකුත් කරනවා ඇත.

වැඩි විස්තර කොළඹ බාලදක්ෂ මාවතේ පිහිටි යුද හමුදා මූලස්ථානයේ ලංකා ශිෂ්‍ය භට බලකායේ සේනාවිධායක කාර්යාලයෙන් දැනගත හැක.

සේපාල ආටිගල,
මේජර්-ජනරාල්,
යුද්ධ හමුදාපති.

1973 ජනවාරි මස 10 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553, කොළඹ.

1–700—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය (ප්‍රාදේශීය අංශය)

#### ඇසුරුම් පෙට්ටි සෑදීමේ ලෑලි සැපයීම

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ (ප්‍රාදේශීය අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඇසුරුම් පෙට්ටි සෑදීම පිණිස අවශ්‍ය අඟල් 1 හා 1/2 යේ ලෑලි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් හා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් සමන්විත වූ ආයතනයන්ගෙන් 1973 පෙබරවාරි මස 7 වැනි දින පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

2. අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ඕනෑම දිසා අධ්‍යක්ෂ කාර්යාලයක රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් කාර්යාලයෙන් 1973 පෙබරවාරි 6 වන කුජ දින ප. ව. 2 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘතිපත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. වැඩ විස්තර කොළඹ 1, පැරණි මහලේකම් කාර්යාලයේ 3 වන මහලේ පිහිටි වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් (356 වන කාමරය) ලබාගත හැක.

ජේ. සී. පී. ද එස්. වික්‍රමනායක,
ලේකම් වෙනුවට.

1973 ජනවාරි මස 8 වන දින,
කොළඹ 1, මහලේකම් කාර්යාලය,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය.

1–663—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

#### ගොඩනැගිලි ඉදිකිරීම

පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1973 පෙබරවාරි මස 6 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ලබාගත හැකිය.

3. මේ සඳහා ටෙන්ඩර් කළ හැක්කේ රජයේ සෑම දෙපාර්තමේන්තුවකම කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් 1,50,000කට වැඩි වටිනාකමකින් යුත් ලියාපදිංචි හා මාස 4 කින් නිම කිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, කම්කරුවන් ඉතා පහසුවෙන් ලබාගත හැකි කොන්ත්‍රාත්කරුවන්ටය. කෘෂිකර්ම අධ්‍යක්ෂට සතුටුදායක ලෙස නියමිත කාලය තුළ ගොඩනැගිලි නිම කිරීමට නොහැකි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් කළයුතු නොවේ.

බීට්—7268—තෝවාසිකාගාර ගොඩනැගිල්ල—උඩුගොඩ සත්ව ගොවිපල

බීට්—7269—දේශනශාලා ගොඩනැගිලි 2 යි—උඩුගොඩ සත්ව ගොවිපල

බීට්—7270—2 බී වර්ගයේ ගොඩනැගිල්ල—උඩුගොඩ සත්ව ගොවිපල

4. (අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිලි ද,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක් ද, ඉදිරිපත් කළ විට 1973 පෙබරවාරි මස 5 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 ගිණුමට බැර කරමින් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 3 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

1–573/1—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### ගොඩනැගිලි ඉදිකිරීම

පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1973 පෙබරවාරි මස 6 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ලබාගත හැකිය.

3. මේ සඳහා ටෙන්ඩර් කළ හැක්කේ රජයේ සෑම දෙපාර්තමේන්තුවකම කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් 75,000කට වැඩි වටිනාකමකින් යුත් ලියාපදිංචි හා මාස 4 කින් නිම කිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, කම්කරුවන් ඉතා පහසුවෙන් ලබාගත හැකි කොන්ත්‍රාත්කරුවන්ටය. කෘෂිකර්ම අධ්‍යක්ෂට

සතුටුදායක ලෙස නියමිත කාලය තුළ ගොඩනැගිලි නිම කිරීමට නොහැකි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් කළයුතු නොවේ.

බීටී—7265—1 ඒ ද්විත්ව නිවාස 1—වීරවිල සත්ව ගොවිපල
බීටී—7266—1 ඒ ද්විත්ව නිවාස 3—නවසීලන්ත-අඹේවෙල ගොවිපල
බීටී—7267—1 ඒ ද්විත්ව නිවාස 1—කන්දකඩුව සත්ව ගොවිපල

4. (අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ද,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක් ද ඉදිරිපත් කළ විට 1973 පෙබරවාරි මස 5 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 ගිණුමට බැර කරමින් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 3 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

1–573/2—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1973 මුදල් වර්ෂය තුලදී ත්‍රිකුණාමලය, මින්නේරිය, කන්දරෝදේ, මැදිරිගිරිය, දිඹුලාගල, පොලොන්නරුව, රිටිගල, පදවිය, තිස්සමහාරාමය, තිරියාය, වෙල්ගම්වෙහෙර (පෙරියකුලම), මාලිගාවිල (ඔක්කම්පිටිය), කෝට්ටේ, මැණික්දෙන, සීගිරිය, පඬුවස්නුවර (හෙට්ටිපොල), අරන්කැලේ, යාපහුව, රාජාංගනය, දැළිවල, මහුල් මහ විහාරය (ලාහුගල), මොට්ටුන්න, ගඩලාදෙනිය, බිහල්පොල, යාපනය ගාල්ල, දැදිගම, අම්බලන්තොට, අම්පාර, අනුරාධපුර, මිහින්තලේ, මහනුවර සහ දීඝවාපි යන ස්ථානවල පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ පොලවල්වලට පොල්අතු, හුනු, වැලි, සක්කගල්, කඩාසු කළුගල්, බොරළු සහ ගඩොල් සැපයීම සඳහා කොළඹ 7, පුරාවිද්‍යා කොමසාරිස් තැන විසින් 1973 ජනවාරි මස 31 වෙනි දහවල් 12 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. පුරාවිද්‍යා කොමසාරිස්තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘතිපත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුයි. එක් එක් ස්ථානය සඳහා ටෙන්ඩර් ඇප මුදල් වශයෙන් රුපියල් 20 බැගින් එවිය යුතු අතර 1973 ජනවාරි මස 30 වෙනි දින පෙරවරු 10 තෙක් ඉහත සඳහන් ස්ථාන සඳහා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම ඇප මුදල මෙම කාර්යාලයට පැමිණ හෝ පුරාවිද්‍යා කොමසාරිස්තැන නමට මුදල් ඇණවුමක් එවීමෙන් හෝ ගෙවිය හැක.

3. වැඩිදුර විස්තර පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

රාජා ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

අංක: එස්. එස්. 6/73,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1973 ජනවාරි මස 08 වැනි දින,

1–609—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### හලාවත ප්‍රදේශයේ පිහිටි පාසල්වලට ඇදිනැස කිරි විස්කෝතු ප්‍රවාහනය කිරීම, 1973

1973 ජනවාරි 1 ද සිට 1973 දෙසැම්බර් 31 ද දක්වා සමයේදී මතු සඳහන් සේවා සලසනු සඳහා හලාවත අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1973 ජනවාරි 27 වන දින පෙ. ව. 10 තෙක් දෙපිටපතකින් යුත් අස් එබූ (සීල් තබන ලද) ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

"එකක රු. 20 බැගින් වූ (කිරිටුවෙන්) විස්කෝතු අඩංගු දිගටි හතරැස් කාඩ්බෝඩ් පෙට්ටිවල අසුරන ලද ඇදිනැස කිරි විස්කෝතු සැපයුම් ස්ථානයේ සිට හලාවත ප්‍රදේශයේ පාසල් කරා ප්‍රවාහනය කිරීම."

පහත සඳහන් එක් එක් සේවාව සඳහා වෙන වෙනම ටෙන්ඩර් භාරගනු ඇත :—

**මාහෝ සැපයීම් මධ්‍යස්ථානයේ සිට**

| | |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 1. නිකවැරටිය මණ්ඩලය. |

**මාදම්පේ සැපයීම් ස්ථානයේ සිට**

| | |
|---|---|
| හලාවත සහ කුරුණෑගල (කොටසක්) දිස්ත්‍රික්ක | 2. හලාවත, නාත්තන්ඩිය, වෙන්නප්පුව, උඩුබද්දාව හා බිංගිරිය මණ්ඩල. |

**පුත්තලම සැපයීම් මධ්‍යස්ථානයේ සිට**

| | |
|---|---|
| පුත්තලම හා කුරුණෑගල (කොටසක්) දිස්ත්‍රික්ක | 3. ආනමඩුව හා පුත්තලම මණ්ඩල. |

2. හලාවත ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතුයි. එක් එක් සේවාවන් සඳහා හලාවත අධ්‍යාපන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 100ක් බැගින් තැන්පත් කර ලබා ගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් 1973 ජනවාරි 26 වැනි සිකුරාදා පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිති විසින් ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යයි.

3. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ විගස ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට පුළුවන.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාර දීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000 කට නොඅඩු වටිනාකමක් ඇති නිශ්චල දේපොළ ඇති බවට තම ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරීතුමාගෙන් මෑතකදී ලබා ගත් සහතිකයක්ද ඉහත 1 වන ඡේදයේ සඳහන් එක් එක් සේවාව සඳහා ඉල්ලුම් කරු නමින් ලියාපදිංචි කරන ලද මේ වර්ෂයට වලංගු බලපත්‍රයක් ඇති ලොරියක්වත් ඇති බවට සෑහෙන සාක්ෂිද හලාවත ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුයි. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර එකී සමිතියට ඉහත 1 වන ඡේදයේ සඳහන් සේවාවන් ඉටු කිරීමට හැකියාවක් ඇති බවට හා අඩු වශයෙන් එක් ලොරියක්වත් ඇති බවට අදාල පරිදි සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ ලබාගත් සහතිකයක් හලාවත අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචි කිරීමේ පොත සහ ලොරි බලපත්‍ර පෙන්නුම් කළ යුතුයි. අවශ්‍ය දේවල් ඉටු කළ නොහැකි ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් පත් නිකුත් කරනු නො ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථමයෙන්, එක් එක් සේවාවන් සඳහා අවශ්‍යතාවයන් අනුව, එක් ලොරියකට වැඩියෙන් තිබීම අවශ්‍ය බව දැන්වීමට හලාවත ප්‍රදේශය අධ්‍යාපන අධ්‍යක්ෂට බලය ඇත.

5. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් භාර නොගැනීමට හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට බලය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු වේ. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය ගැනීමට ටෙන්ඩර්කරුවන් කැමති වී සිටිය යුතුය.

6. අමතර විස්තර සඳහා හලාවත අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ඉල්ලුම් කරන්න.

ආර්. ජේ. බී. ආරියරත්නම්,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 5 වැනි දින,
හලාවත, අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

1–589—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය**

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1973 මාර්තු මස 1 දින සිට 1973 දෙසැම්බර් මස 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. එසේ වුවත්, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, රත්නපුර, සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට, ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට කැමති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මූදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයේ 5 වන තීරය බලන්න.

(i) රෝගියකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුයි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කර ගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන් වලට ලබා ගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩුකර ගනු ලැබේ.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයෙක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, මාතර '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩර් තීරණය.**—ටෙන්ඩර් පත් තෝරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයෙහි '' බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

1973 ජනවාරි මස 03 වෙනි දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

අයි. ඒ. එස්. සිරිවර්ධන,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

### උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | | රෝගීන්ට | | | | |
| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් බාර ගන්නා අවසාන දිනය හා වේලාව | අලුත්මාළු | හරක්මස් | කරවල | එළවළු | බිත්තර | අලුත්මාළු | හරක්මස් | කරවල | එළවළු | බිත්තර |
| | රු. | රු. | | | | | | | | | | | |
| 1. කිරම මා.නි. .. | 100... | 300 | 1973 පෙබරවාරි මස 20 දින පෙ.ව. 10.00 ට | 50... | 50... | 50... | 150... | 50... | 400... | 400... | 400... | 1,500... | 400 |
| 2. කොටපොල මා.නි. | 100... | 400 | | 100... | 100... | 100... | 300... | 100... | 300... | 300... | 300... | 1,500... | 300 |
| 3. පල්ලේගම මා.නි. ... | 100... | 300 | | 200... | 200... | 150... | 600... | 200... | 300... | 300... | 300... | 1,100... | 300 |

1–567—73.01.19 දින අංක 43 දරන ගැසට් පත්‍රය

---

**වැලිකඩ බන්ධනාගාරයේ, මැගසින් බන්ධනාගාරයේ, සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ මුළුතැන්ගෙයි ඉවත දමන පොල් කුඩු සහ ඉඳුල් කෑම මිලයට ගැනීම**

වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරි විසින් 1973 පෙබරවාරි මස 02 වැනි දින පෙරවරු 10 දක්වා ඉහත සඳහන් ස්ථානයන්හි මුළුතැන්ගෙයින් ඉවත දමන පොල් කුඩු සහ ඉඳුල් කෑම 1973 පෙබරවාරි මස 15 වෙනි දින සිට 1973 දෙසැම්බර් 31 වෙනි දින දක්වා වූ එක් (1) අවුරුදු කාලය තුල මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන්නවුන් විසින් වැලිකඩ බන්ධනාගාර අධිකාරි කාර්යාලයේ රුපියල් 25 ක ඇප මුදලක් තැන්පත් කර ලබා ගත්තාවූ කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුය. යම් කෙනෙකුගේ ටෙන්ඩර් පත තෝරාගත් බව ලියවිල්ලකින් දැන්වීමෙන් අනතුරුව ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු 1973 පෙබරවාරි මස 15 වෙනි දින සිට එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂෙප කිරීම එම ඇප මුදල් රාජසන්තක වීමට හේතුවේ. ටෙන්ඩරය පිළිගැනීමේ දැන්වීම ඔහු විසින් සඳහන් කරන ලද ලිපිනයට තැපැලෙන් හෝ අතින් ගෙන ගොස් භාර දුනහොත් එකී දැන්වීම ඔහුට ලැබුණු බව පිළිගැනීමට එය ප්‍රමාණවත් වේ. ටෙන්ඩර්කරුවන්ගේ ඇප තැන්පත් මුදල්, තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම රුපියල් 25 ක් තැන්පත් කර ලබා ගත්තාවූ කුවිතාන්සියක් සමග මසකට පොල් කුඩු සහ ඉඳුල් කෑම වෙනුවෙන් ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තුවන මිළ ගණන් වෙන් වෙන් වශයෙන් සඳහන් කර ලියුම් කවරයක බහා, සීල් තබා ලියුම් කවරයේ ඉදිරිපස වම් කෙළවරේ ඉහළ කොනේ "වැලිකඩ බන්ධනාගාරයේ, මැගසින් බන්ධනාගාරයේ, සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ මුළුතැන්ගෙයින් ඉවත දමන පොල් කුඩු සහ ඉඳුල් කෑම මිළයට ගැනීම" යන්න පැහැදිළිව සඳහන් කර මෙහි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. මේ සඳහා මුද්‍රිත ටෙන්ඩර් පත් නොමැත.

4. 1973 පෙබරවාරි මස 02 වෙනි දින පෙරවරු 10.05 ට වැලිකඩ බන්ධනාගාර අධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහිදී පෙනී සිටීමට අවසර තිබේ.

5. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වැලිකඩ බන්ධනාගාර අධිකාරීගෙන් දැන ගැනීමට හැකිය.

සයිමන් ද සිල්වා,
අධිකාරී, වැලිකඩ බන්ධනාගාරය.

බන්ධනාගාර අධිකාරී කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9.
1973 ජනවාරි මස 01 වන දින.

1–712—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**රාජ්‍ය දැව සංස්ථාව**

**මාර්ග ඉදිකිරීම—දියදාව වනය**

මොරවක ගම්කාර්ය සහා ප්‍රදේශයේ දියදාව වනයෙහි මාර්ග ඉදිකිරීම සඳහා සිල් තැබූ ටෙන්ඩර් පත් රාජ්‍ය දැව සංස්ථාවේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ රුපියල් 1,00,000 සහ ඊට වැඩි වටිනාකමක් දරණ වැඩ සඳහා රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථා වල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති විසින් බාරගනු ලැබේ.

1973.02.01 වැනි දින ප. ව. 2 දක්වා කොළඹ 5, වජිර පටුමගෙහි අංක 7 දරණ ස්ථානයේ පිහිටි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරණු ලැබේ. 73.02.02 වැනි දින දහවල් 12 ට ටෙන්ඩර් වසනු ලැබේ. වැඩි විස්තර සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ මාතර, බඩු ගබඩා පාරේ අංක 10 දරණ තැන පිහිටි ප්‍රාදේශීය කළමනාකරුගේ කාර්යාලයෙන් සහ අකුරැස්ස හභ කාර ප්‍රාදේශීය කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

1–715—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව**

මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි කොට්ඨාශය

1973 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා (1973.01.01 දින සිට 1973.6.30 දක්වා) මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ පාලනය වන ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි තැනීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි.

මෙහි පහත සඳහන් දිස්ත්‍රික්කයන් තුල මෙහි පහතින් දක්වා ඇති ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ටෙන්ඩර් පත්‍ර 1973 පෙබරවාරි මස 02 දින දහවල් 12 දක්වා බාරගනු ලැබේ.

2. (1) බදුල්ල දිස්ත්‍රික්කය—නාගදීප I පියවර සහ මහියංගන පොදු ගොඩනැගිලි අංශය.
(2) මාතලේ දිස්ත්‍රික්කය—මිනිපේ III හා IV පියවර.
(3) අම්පාර දිස්ත්‍රික්කය—කොන්ඩුවටුවාන පොදු ගොඩනැගිලි අංශය.

3. (අ) පිලිස්සූ ගඩොල් දහස් ගනනින්, දහසක් කීය බැගින්ද? (එකක ප්‍රමාණය ($8\frac{3}{4}''\times4\frac{1}{2}''\times2\frac{3}{4}''$) බැගින් විය යුතුය. ගඩොල් පෝරනය ව්‍යාපාරය සිට සැතපුම් 5ක් ඇතුළත විය යුතුය).
(ආ) ඉරු දෙක බැගින් යුතු පොල්අතු දහස් ගණනින් සැපයීම සඳහා දහසක් කීය බැගින්ද? (එකක් දිගින් අඩි 7 ටත් පලලින් අඟල් 12 ටත් නොඅඩු ඒවා විය යුතුය.)
(ඇ) අළු හුණු බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින්ද? (බුසලක බර රාත්තල් 44 කට නොඅඩු විය යුතුය.)
(ඈ) තම්බාපු හුණු බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින්ද?
(ඉ) අඟල් $\frac{1}{2}$ සිට අඟල් 2 දක්වාවූ ප්‍රමාණවල කැටගල් එක් එක් වර්ගය කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින්ද?

(ඊ) කළුගල් 6"×4" කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

(උ) කළුගල් 6"×9" කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

(ඌ) ගංගා වැලි කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

4. ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍ය නිපයෙන ස්ථානයෙහිදීම සැපයීම සඳහාද, ඉහත සඳහන් ව්‍යාපාරයන්හි පිහිටි වැඩපළවල් වෙත ගෙනගොස් සැපයීම සඳහාද, වෙන වෙනම මිල ගණන් සඳහන් කළ යුතුය.

5. මහියංගන ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් රුපියල් පණහක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ඒ බැව් දක්වෙන කුවිතාන්සියක් මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 1973 පෙබරවාරි මස 1 දින දහවල් 12 දක්වා මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරී විසින් නියමිත ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. සෑම ටෙන්ඩරයක් ම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි තැනීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයේ වම්පස යට කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය සඳහන් කර එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලේඛනගත තැපෑලෙනි. නැතහොත් මහියංගණ ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. සාර්ථක ටෙන්ඩර්කරුට ටෙන්ඩර් පිළිගත් බව දන්වා දෙසතියක් ඇතුළත සිට එකී ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට අපොහොසත් වුව හොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රජය සතුකොට ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලැයිස්තුවේ අඩංගු කරනු ලැබේ.

7. මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරීතැනගේ කාර්යාලයේදී 1973 පෙබරවාරි මස 2 දින පස්වරු 2 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍යයයි හැඟියන්නේ නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවට මෙහි පැමිණ සිටිය හැක.

8. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාරගැනීමේ අයිතිය මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරී සතුය.

ඩබ්ලිව්. ඊ. ද සොයිසා,
ඉඩම් සංවර්ධන නිලධාරී, මහියංගනය.

1973 ජනවාරි මස 6 දින,
මහියංගන ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

1–711—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

**සුරාබදු දෙපාර්තමේන්තුව**

**සීවී 5188 දරණ පාවිච්චි කළ නොහැකි දෙපාර්තමේන්තු වාහනය විකිණීම සඳහා වූ ටෙන්ඩරයේ ප්‍රතිඵල**

(අ) ලත් ටෙන්ඩර්වල මුළු ගණන: 5.

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය: **එස්. නවරත්න මහතා, 290/8, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.**

(ඉ) පිළිගත් මිල ගණන් : රු. 6,777.

**හේ. බ. විජේකෝන්,**
**සුරාබදු කොමසාරිස්.**

**1973.01.04** වන දින,
කොළඹ.

1–587—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

**රේගු වෙන්දේසියක්**

**පහත සඳහන් භාණ්ඩ 1973.02.06 වන දින පෙ. ව. 9.30 ට කොටුව අංක 1 ගුදමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**මෙම බඩු 1973.02.05 වන දින පෙ. ව. 10 ත් මධ්‍යහ්න 12 ත් අතර** පරීක්ෂා කළ හැක.

බඩු විකිණීමට ඉහලම ලංසුව පිළිගත් සැනෙකින්, එම ලංසුව ඉදිරිපත් කළ තැනැත්තා විසින් ඉන් සියයට 50 ක මුදලක් එම භාණ්ඩය වෙනුවෙන් තැන්පත් කළ යුතුය.

වෙන්දේසියේ අනෙකුත් කොන්දේසි සඳහා 1954.5.28 වන දින රාජ්‍ය ගැසට් පත්‍ර බලන්න.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

**මගේ අංකය : පිඹ/විකිණීම්/1/73.**
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.

1. ඉරිගිය හා දිරාගිය—කපු සරොන් 3,
2. **මළකෑ—කපු කමිස රෙදි යාර 21½ ක්**
3. මළකෑ නයිලෝන් සාරි 1—ඇල් 5ක්
4. **මළකෑ පෝලන්ත මුද්‍රිත කපු කමිස රෙදි යාර 30 ක්**
5. මළකෑ කපු වේට්ටි 6 ක්
6. ඉරීගිය හා දිරාගිය කපුසරොන් 2 ක්
7. ඉරීගිය කපු සරොන් 1 ක්
8. දිරාගිය මැසූ කපු සරොන් 1 ක්
9. දිරාගිය කපු කමිස රෙදි යාර 3½ ක්
10. **මළකෑ කපු සරොන් 11 ක්**
11. සුදු කපු කමිස රෙදි යාර 3½ ක්.
12. මළකෑ කෘතිම සේද රෙදි යාර 3 ක්
13. කපු වේට්ටි (කෑලි) 8 ක්
14. කපු පොප්ලින් යාර ¾ ක්
15. දිරාගිය කමිස රෙදි යාර 2 ක්
16. දිරාගිය හා ඉරීගිය කපු පොප්ලින් යාර 9 ක්
17. දිරාගිය හා ඉරීගිය කපු පොප්ලින් යාර 5 ක්
18. දිරා ගිය සාරි රෙදි (කෑලි) 1 යාර 9 ක්
    දිරා ගිය සාරි රෙදි (කෑලි 1) යාර 4½ ක්, දිරා ගිය කපු පොප්ලින් යාර 23 ක්
19. දිරාගිය කපු පොප්ලින් (කෑලි 1) යාර 19½ ක්
    දිරාගිය කපු පොප්ලින් (කෑලි 1) යාර 30 ක්
20. දිරාගිය කපු පොප්ලින් (කෑලි 1) යාර 32 ක්
    දිරාගිය කපු පොප්ලින් (කෑලි 1) යාර 32 ක්
21. දිරාගිය අඟල් 36 කමිස රෙදි (කෑලි 1) යාර 40 ක්
22. දිරාගිය චිත පොප්ලින් (කෑලි 1) යාර 30 ක්
23. දිරාගිය කපු සරොන් 2 ක්
24. දිරාගිය සාරි රෙදි යාර 24 ක්
25. දිරාගිය වර්ණ ටෙටොරොන් රෙදි යාර 8 ක්
26. දිරාගිය නයිලෙක්ස් රෙදි යාර 18 ක්, නිල් පැහැ නයිලෙක්ස් රෙදියාර 18½, පටි 1 ක්
27. හම් කවරය සහිත (අසම්පූර්ණ) **එස් ආර්—එච් 506 ස්ටැන්ඩර්ඩ්** ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1 ක්
28. මදක් දිරාඇති ටෙරිලීන් කමිස රෙදි (කෑලි) යාර 5¼ ක්
29. දිරාගිය නයිලෙක්ස් රෙදි (කෑලි) යාර 27 ක්
30. හම් කවරය සහිත (අසම්පූර්ණ) ස්ටැන්ඩර්ඩ් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1 ක්
31. ෂොක් ඇබ්සෝබර් 4 ක්
32. කටවුට් 1 ක්, ෂාෆ්ට් 1, පැරණි යන්ත්‍ර කොටස් 1 ක්
33. ඇණ පෙට්ටි 1 ක්
34. තමොස්ටැටික් එක්ස්පැන්ෂන් වැල්ව් 1 ක්,
35. හම් කවරය සහිත (අසම්පූර්ණ ස්ටැන්ඩර්ඩ් 8 ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1ක්
36. හබලපෙති රාත්තල් 1 ක්
    දෙහි මිශ්‍රණ බෝතල් 1ක්
    දොඩම් මිශ්‍ර බෝතල් 1 ක්
    "හොල්ස්ටන්" බීර බෝතල් 2 ක්
    "ඩෙල් මොන්ටේ" මිරිස් සෝස් බෝතල් 1 ක්
    තක්කාලි ජූස් ටින් 2 ක්
    උකු කිරි ටින් 2 ක්
    දොඩම් ජූස් ටින් 1 ක්
    ඇස්පරාගිස් ටින් 2 ක්
    තක්කාලි ටින් 1 ක්
    චට්නි බෝතල් 1 ක්
    සැන්ඩ්විස් පේස් ටින් 2 ක්

37. පිලිප්ස් විදුලි ෂේවර් 1 ක්, සිගරට් ලයිටර් 1 ක්
38. එල්ලන ලාම්පු 1ක්
39. ඇඳ ඇතිරිලි 1 ක්
40. ජර්කින් 1 ක්, සිල්වර් ස්ටාර් ඉලාස්ටික් අගල් 36 පැකට් 4
කපු ටෙට්රින් කමිස, 15½-32-2 ක්
15½-33 ටෙට්රොන් කමිස 1 ක්
16½-33 ටෙට්රොන් කමිස 1 ක්
41. දිරාගිය කනෙබෝ කමිස රෙදි රෝලක් යාර 60 ක්
42. ලා කොළ පැහැති ටෙට්රොන් යාර 4 ක්
පොප්ලින් යාර 1 ක්
පොප්ලින් යාර 3 ක්
පොප්ලින් යාර 3 ක්
43. දිරාගිය හා ඉරීගිය කපු සාරි 30 ක්, දිරා ගිය හා ඉරීගිය කෘතිම
ෂේද කමිස රෙදිකෑලි 2 ක්
44. එකක් යාර 25, ටෙට්රොන් කමිස රෙදි රෝල් 5 ක්
45. අත් ඔර්ලෝසු පටි 12 ක්
46. ෂයිව් රුම් පෙන්ලයිට් බැටරි 75 ක්
47. වීදුරු බෝල 85 ක්
48. කාන්තා පාවහන් කුට්ටම් 1 ක්
49. අංක 2 ප්‍රභාත් භූමිතෙල් උදුන් 12 ක්
49. අංක 3 ප්‍රභාත් භූමිතෙල් උදුන් 4 ක්
50. කැප්සූල් 10, මිලිග්‍රෑම් 250 ඉලොසෝන් පැකට් 35 ක්
51. ෂොක් ඇබ්සෝබර් 14 ක්
52. ෂොක් ඇබ්සෝබර් 3 ක්
53. පිස්ටන් 5 ක්,
54. ජපානයේ නිෂ්පාදිත බෝල් රේසර් 81 ක්
එක්සත් රාජ්‍යයේ බෝල් රේසර් 40 ක්
55.
56.
57. රේසර් 6 ක්
58. ඉරෝස්ටික් 528-පින් 53 ක්
59. ඉරෝස්ටික් 528-පින් 51 ක්
60. ඉරෝස්ටික් 528-පින් 24 ක්
61. ඉරෝස්ටික් 528-පින් 72 ක්
62. බෝල්පොයින්ට් රීෆිල් 144 පැකැට්ටු 475
63. දිරාගිය කපු සරොන් 5 ක්,
64. අයිබ්‍රෝ පෙන්සිල් 5,600 ක්
65. අයිබ්‍රෝ පෙන්සිල් 144 පැකැට්ටු 31 ක්
අයිබ්‍රෝ පෙන්සිල් 12 කාඩ් 6 ක්
66. හෙයර් ස්ලයිඩ් පැකට් 82 ක්
67. සෙල්ලම් අත් ඔර්ලෝසු 144×10 ක්
68. ස්වර්ණාභරණ පෙට්ටි ක්ලිප් 144 පැකට් 65 ක්
69. සූට් කේස් ලොක් 17 ක්
70. (ප්ලාස්ටික්) ඉන්ක් පිලර් 12×305
71. කමිස බොත්තම් පෙට්ටි 2 ක්
72. ප්ලාස්ටික් වළලු ජෝඩු 48×580
73. සාරි බෝඩර් ප්‍රමාණයක්
74. අඟල් 2 සාරි බෝඩර් රෝල් 72—අඟල් 2½ සාරි බෝඩර්
රෝල් 67 ක්
75. ඇස්. කන්නාඩි කුට්ටම් 450 ක්
76. කුරුඳු තෙල් බෝතල් 30 ක්
77. එකක් 28,800 ක් අඩංගු කලිසම් ගාංචු පෙට්ටි 10 ක්
78. රිබන් රෝල් 512 ක්
79. ප්ලාස්ටික් සිපින් රෝල් 62 ක්
80. කට්ටු මරම් 1 ක්

1–659—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් මෝටර් කාර් රථය 1973 පෙබරවාරි මස 3 වෙනි දින පෙ. ව. 9.30 ට කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ මගින්ගේ පර්යන්ත ගොඩනැගිල්ල අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 පෙබරවාරි මස 2 වෙනි දින සාමාන්‍ය වැඩකරන වේලාව තුලදී ගැණුම් කරුවනට එය පරීක්ෂාකර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් එහි වටිනාකමින් සියයට 50 මුදලක් තැන්පත් කළ යුතුය.

වෙන්දේසිය අනුමත කර දින හතක් ඇතුලතදී සම්පූර්ණ මුදල ගෙවා, එය ගෙන නොගියහොත් එය නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අතිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

මර්සිඩීස් බෙන්ස් ඔටොමැටික් මෝටර් කාර් රථයක් (පාවිච්චි කල) ඩබ්. එන්. ඩී. වයි. 933—වමෙන් පැදවීම—දකුණේ "හෙඩ් ලයිට්" එක, මඩ්ගාඩ් එක සහ බොනට් එක පළුදුවී ඇත.

ඩී. ඇස්. මැන්දිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: ඒඩී/විකිණීම්/91—ඩීඑම් 72/110
1973 ජනවාරි මස 8 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ දී ය.

1–683—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසිය

කැකිරාව අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇති ඝන අඩි 566.8 සමාන හල්මිල්ල, බුරුත, රාණි, මිල්ල සහ පලු ආදී වර්ග වලින් සමන්විත කඳන් 103 ක්ද, ඝන අඩි 49.7 කට සමාන බුරුත, රාණි, මිල්ල සහ ඇටතිඹිරි ආදී වර්ග වලින් සමන්විත ඉරු ලී කෑලි 73 ක් ද, ඝන අඩි 34.7 කට සමාන හුලංහික්, බුරුත, රාණි ආදී වර්ග වලින් සමන්විත ලෑලි කෑලි 71 ක්ද, සාමාන්‍ය කණු 1 වැනි පන්තියේ 25 ක්ද, 2 වැනි පන්තියේ 200 ක්ද, 3 වැනි පන්තියේ 500 ක්ද, තේක්ක කණු 1 වැනි පන්තියේ 500 ක්ද, 2 වැනි පන්තියේ 415 ක්ද, සිල්බර කඳන් 50 ක්ද, ඊප්ප 6 ක්ද, උදලු 45 ක්ද, බණ්ඩි කියත් 13 ක්ද, කැති 34 ක්ද, පොරෝ 17 ක් ද, වතුර කෑන් 6 ක්ද, දඬු අඬු 3 ක්ද, හරස් කියත් 2 ක්ද, පුට්රුල් 2 ක්ද, පිහියා 2 ක්ද, (මිට දිග) පිහියක් ද, පයිල් එකක්ද, අත් කියත් එකක්ද, දැති කියත් එකක්ද, යකඩ කුඤ්ඤ එකක්ද, අලවංගු එකක්ද, ලඹයක් සහ ඉණුවක්ද, 1973.01.30 වැනි දින පෙ. ව. 10 ට කැකිරාව අඩවි වන කාර්යාලයේදී ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරි, උ. මැ. දි. විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව දැව ද්‍රව්‍ය පරීක්ෂාකර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ මැඩිමතත් විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් හෝ කැකිරාව අඩවි වන නිලධාරීගෙන් හෝ ලබාගත හැකිය.

ඇන්. සිත්තම්පලම්,
දිසා වන නිලධාරි (උ. මැ. දි.).

දිසා වන නිලධාරි කාර්යාලය,
ත්‍රිකුණාමලය,
1972. 12. 27 වන දින.

1–685—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසියක්

පහත සඳහන් මොටෝරිය 1973 ජනවාරි මස 27 වැනි දින පෙරවරු 10 ට රේගු පර්යන්ත ගොඩනැගිල්ලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10 සිට මධ්‍යහනය දක්වා එම රථය ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රදර්ශණය කරනු ලැබේ. මේ සම්බන්ධ අවශ්‍ය තොරතුරු රේගුවේ නිවාරන අංශයෙන් ලබාගත හැකිය.

ඉදිරිපත් කරනු ලබන ඉහලම ලංසුව හා වෙන්දේසිය රේගු අයකැමි විසින් අනුමත කරනු ලැබුවහොත්, වෙන්දේසිය අවසාන යේදී මුළු මුදලම ගෙවා රථය රේගුවෙන් ඉවත් කරගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

පෝඩ් කෝටිනා (අමතර රෝද දෙකක් හා අතිකුත් අමතර කොටස් ඇතුළුව)
පිටරට ලියාපදිංචි කළ අංකය : 343 ඇම්.ඒ.ආර්.

ඊ. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1973 ජනවාරි මස 01 වැනි දින,
නිවාරන කාර්යාලය,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ.

1–568—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## වවුනියා දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1973

මාර්තු මස 1 සිට 1973 සැප්තැම්බර් මස 30 දින දක්වා කාලය සඳහා

1973 මාර්තු මස 1 සිට 1973 සැප්තැම්බර් මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදාළ කොන්දේසි මාලාවට යටත්ව 1972 ඔක්තෝබර් 31 වැනි දින ප්‍රකාශයට පත් අංක 31/3 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උප ලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත "1973 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිලයට ගැණිමේ ටෙන්ඩරය" යි සඳහන් කර 1973 පෙබරවාරි 7 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකියි.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණියහොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැතිවූද, ටෙන්ඩරයේ දැක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට 25 කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූ ද, ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත් අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර් වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදාළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවර ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සිල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළයුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුම් නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමඟම රු. 1,000 කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ටෙන්ඩර් පත්‍ර ලබාගත් නමුත්, ටෙන්ඩර් ඉදිරිපත් නොකළ අය, ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ඉල්ලීමේදී මුලින් ලබාගත් ටෙන්ඩර් පත්‍ර ආපසු භාර දිය යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය වවුනියාව දිසාපති තුමා සතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රා රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

10. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම් පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපති තුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුය.

11. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

### උප ලේඛනය

| අංකය හා ප්‍රදේශය | තැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | ටෙන්ඩරය භාරගන්නා අවසන් වේලාව |
|---|---|---|
| 2. වලයන්මඩම ... | ගම් සීමාව තුල ... | පෙ.ව. 11.00 ට |
| අලම්පිල් ... | ගම් සීමාව තුල ... | පෙ.ව. 11.30 ට |

එස්. සිවඥනම්,
වවුනියා දිසාපති වෙනුවට,
අතිරේක දිසාපති.

1973 ජනවාරි මස 09 වැනි දින,
වවුනියා දිසාපති කාර්‍යාලයේ දීය.

1–752—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)
### දැන්වීමයි

මෙහි පහත නම සඳහන් ගාලු දිස්ත්‍රික්කයේ වලහන්දූවේ මානවිල පදිංචි ගාර්දියේ වසන් හොරදූගොඩ ගම්මගේ සුමනදාස තිලකරත්න වන මම මිළඟට පැවැත්වෙන සිංහල නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා අයදුම් පතක් මෙතැන් සිට මාසයක් ඉකුත් වූ පසුව රිජිස්ට්‍රාර් ජනරාල් තුමාවෙත ඉදිරිපත් කරන බව සියලු දෙනාගේම දැනගැනීම පිණිස මෙයින් දන්වමි.

ජී. එච්. සුමනදාස තිලකරත්න,
ප්‍රසිද්ධ ලිපිකරු තැන.

1973 ජනවාරි මස 08 වන දින,

1–689—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කළුතර දිශාවෙහි හඳපාන්ගොඩ කෑකුලාදල "සඳගිරි" හි පදිංචි ගොඩගේවගේ පද්මසේන ගොඩගේවගේ වන මම නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහාත් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කරගනු ලැබීම සඳහාත් මෙතැන් සිට මාසයක් ගිය තැන රෙජිස්ට්රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලාසිටීමට අදහස් කර ඇති බව වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපනත්හි 107 වෙනි අධිකාරිය පිළිබඳ පළමුවෙනි උපලේඛනයෙහි "බී" කොටසෙහි දෙවෙනි වගන්තිය අනුව රජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

මෙයට,
ජී. පී. ගොඩගේවගේ.

1973 ජනවාරි මස 10 දින,
1–732—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණය සඳහා ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

රත්නපුරයේ ඇලපාත (උතුර) අංක 258/1, නිවසෙහි පදිංචි රාජපක්ෂ ජයසිංහ මුදියන්සේලාගේ සෝමරත්න ජයසිංහ වන මම අද සිට දූරා මසක් ගතවූ පසු, රත්නපුර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ර. ජ. මු. සෝමරත්න ජයසිංහ.

1973 ජනවාරි 08,
අංක 258/1,
ඇලපාත (උතුර), රත්නපුර.

1–688—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### පිරිපහදු අංශය

### 1973 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් වැඩ සඳහා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශයේ ලියාපදිංචි වීමට කැමැති කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

1. සිවිල් වැඩ (සුළු)
2. සිවිල් වැඩ (ප්‍රධාන)
3. තෙල් ගබඩා ටැංකි පවිත්‍ර කිරීම.
4. උපකරණ, ව්‍යුහමය වානේ වැඩ, නල ටැංකි හා ගොඩනැගිලි පින්තාරු කිරීම.
5. වානේ ව්‍යුහයන් සෑදීම හා ඉදි කිරීම.
6. පිරිපහදු තත්ත්වයනට අනුව නල මාර්ග දැමීම/ගොඩනැඟීම.
7. ලියවීම. විදීම (බෝරගෑසීම) ඇඹරීම, මුවාත් කිරීම, ලෝහ ප්‍රතිසංස්කරණය, පෙරස් හා පෙරස් නොවන වාත්තු කිරීම් යනාදී යන්ත්‍ර හල් වැඩ.
8 පිඩන බඳුන්, තාප හුවමාරු උපකරණ යනාදි පිරිපහදු උපකරණ සෑදීම-රෝල, ස්වයංක්‍රිය පෑතිකඩ කැපුම් යන්ත්‍ර, ද්‍රාව පීඩක, මධ්‍යම ලීශවන පව්වල්, ඛමර-විදුම් යන්ත්‍ර, රත්, හැඩතැලීම යනාදිය තිබෙන බව හා ඒවායේ තත්ත්වය දැක්විය යුතුය.

අයදුම්කරුවන් විසින් යථෝක්ත සේවාවන් අතුරෙන් තමන්ට සැපයිය හැකි සේවාවන් පැහැදිලිව දැක්විය යුතු අතර භාර ගැනීමට කැමැති කොන්ත්‍රාත්තුවල වටිනාකමද සඳහන් කළ යුතුය.

'අ' කාණ්ඩය—රු. 1,000 දක්වා
'ආ' කාණ්ඩය—රු. 10,000 දක්වා
'ඇ'කාණ්ඩය—රු. 50,000 දක්වා

ප්‍රථම වරට ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් විසින්, පසුගිය එක්වර්ෂයක් තුල රජයේ දෙපාර්තමේන්තුවලට සහ රාජ්‍ය සංස්ථාවලට සපයන ලද සේවාවන් පිළිබඳව, භාර ගත්තා ලද වැඩ, අදාල දෙපාර්තමේන්තු හා සංස්ථාවල නම්, වැඩ අවසන් කිරීම සඳහා ගතවූකාලයන් හා කොන්ත්‍රාත්තුවල වටිනාකම්ද සඳහන් සියළු විස්තර වෙන් වෙන්ව දැක්විය යුතුයි. සිය වැඩහල්හි ඇති පහසුකම් හා උපකරණ පිළිබඳවද අයදුම්කරුවන් විසින් සඳහන් කළ යුතුය.

පිරිපහදුවේ දැනටමත් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ද එම ලියාපදිංචිය 1973 වර්ෂය සඳහා අළුත්කර ගැනීම පිණිස, නැවත ඉල්ලුම් කළ යුතු වෙයි.

"කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" යන්න ඉහළ වම් කෙළවරෙහි ලියන ලද කවරවල බහා එවිය යුතු සියලුම ඉල්ලුම් පත්‍ර, 1973 ජනවාරි මස 31 වෙනි දින හෝ ඊට පෙර, කැලණිය, තැ. පෙ. අංක 11, පිරිපහදු කළමනාකාරතැන වෙත ලැබිය යුතුය.

පිරිපහදු කළමනාකාරතැන.

1-698—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලා භාවිතය පිණිස අනුමත කරන ලද පන්ති පොත් හා අතිරේක පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනය

1971 සිට මේ වන තෙක් අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලාවන්හි භාවිතය සඳහා නිර්දේශ කරන ලදුව, අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් අනුමත කරන ලද සිංහල පන්ති පොත් හා අතිරේක පන්ති පොත්වල සම්පූර්ණ නාම ලේඛනය පහත පළවේ.

2. අනුමත කරන ලද පොත් අතුරෙන් සුදුසු පොත් තෝරා ගත යුත්තේ 1972 ඔක්තෝබර් 28 වෙනි දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද " වර්ෂ 1973 ජනවාරි 1 වෙනි ද සිට රජයේ පාසල්වල අනිවාර්යයෙන් භාවිත කළ යුතු පොත් " සම්බන්ධයෙන් නිකුත් කර ඇති පා. ස. 6/233 හා 1972.10.28 දිනැති අංක 279 දරණ චක්‍රලේඛයෙනි.

3. අනුමතිය අවලංගු වූ හා මණ්ඩලය විසින් අනුමතිය අළුත් නොකරන ලද පන්ති පොත්හා අතිරේක පන්ති පොත් කපා හැර දනට වලංගුව පවත්නා පන්ති පොත් හා අතිරේක පන්ති පොත් පමණක් මේ ලේඛනයට ඇතුළත් කරන ලද බව සැලකිය යුතුය.

4. පොත්වල වලංගු කාලය විෂයයන් අනුව දක්වා ඇත. පහසුවෙන් දක්ගත හැකි වන පරිදි පොත්වල වලංගු කාලය අනුව විවිධ විෂයයන් යටතේ පොත් ලැයිස්තුව පිළියෙල කර ඇත. මෙහි සඳහන් කාල සීමාවෙන් පසුව පොතක් පාඨශාලා භාවිතය පිණිස වලංගු වන්නේ, යළිත් මණ්ඩලය විසින් එහි අනුමැතිය අළුත් කරනු ලැබුවහොත් පමණි.

5. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද පොත් හැර මේ මණ්ඩලය විසින් නිර්දේශ නොකරන ලද පොත් පාඨශාලා භාවිතය පිණිස යෙදවීම වරදක් බව පාඨශාලා ප්‍රධානීන්ට දන්වා ඇත.

6. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පමුණුවන පාසල් පොත් හා පැරණි සාහිත්‍ය කෘතීන්ගේ නව සංස්කරණ, ගැටපද, සන්න, විවරණ, ශබ්ද කෝෂ, ප්‍රස්තාර ආදියට මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය නොවේ.

7. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද පාසල් පොත්වල නම්, මේ ලේඛනයට ඇතුළත් නොවේ.

8. මෙහි නම් යෙදී ඇති පිළිවෙලින් පොත්වල අගය හෝ ප්‍රමුඛත්වය පිළිබඳ විශේෂයක් පළ නොවන බව සලකන්න.

කේ. එස්. පලිහක්කාර,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ ලේකම්.

1973 ජනවාරි මස 4 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ දී ය.

### බුද්ධ ධර්මය

අනුමතියේ වලංගු කාලය 1972.1.4 සිට 1974.12.31 දක්වා

| පන්ති පොතේ අංකය | පොතේ නම | කර්තෘ | පන්තිය | ප්‍රකාශකයෝ |
|---|---|---|---|---|
| 1. | බුද්ධාගම ... | ... ජයසේකර අබේරුවන් ... | 3 | ... සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 2. | අභිනව පාඨමාර්ගානුකූල බුද්ධාගම | ... ජයසේකර අබේරුවන් ... | 6 | ... එම |
| | අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා | | | |
| 3. | සදහම් මග ... | ... ගරු නාරද හිමි ... | 4 | ... සීමා සහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් |
| 4. | සදහම් මග ... | ... ගරු නාරද හිමි ... | 5 | ... එම |
| 5. | පාඨශාලීය බුද්ධ ධර්මය | ... එස්. එෆ්. ද සිල්වා, ඊ. ආර්. එරන්න, එස්. වණිගතුංග | 8 | ... ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම |

### ඉතිහාසය

අනුමතියේ වලංගු කාලය 1972.1.1 සිට 1974.12.31 දක්වා

| පන්ති පොතේ අංකය | පොතේ නම | කර්තෘ | පන්තිය | ප්‍රකාශකයෝ |
|---|---|---|---|---|
| 1. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරිකම්, නවීන ඉතිහාස කථා–2 | ඇඩ්වින් රණවක | — | සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

අනුමතියේ වලංගු කාලය 1971.1.28 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 2. | නවීන ඉතිහාසය | ගුණසිරි ජී. ද සිල්වා | 6 | රත්නාකර පොත් වෙළඳ ශාලාව |

අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 3. | ලංකා හා ලෝක ඉතිහාසය | ඇස්. ඇප්. ද සිල්වා | 6 | ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම |
| 4. | අපේ උරුමය I | ආචාර්ය ජී. සී. මැන්දිස් | 6 | සීමා සහිත කොළඹ ඇපොතිකරීස් සමාගම |
| 5. | අපේ උරුමය II | එස්. ඊ. පේග්මන්, ආචාර්ය ජී. සී. මැන්දිස් | 7 | එම |

### පොත් තැබීම—පන්ති

අනුමතියේ වලංගු කාලය 1972.1.1 සිට 1974.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | පොත් තැබීම | කේ. ආර්. පෙරේරා | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### භෞතික විද්‍යාව

අනුමතියේ වලංගු කාලය 1971.3.28 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | මූලික භෞතික විද්‍යාව | ජී. එජ්. ඇබට්. එම්. නෙල්කන් | අ.පො.ස.ප. (උසස් පෙළ) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### සෞඛ්‍ය විද්‍යාව

අනුමතියේ වලංගු කාලය 1971.8.20 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | සෞඛ්‍ය විද්‍යාව | දොස්තර එච්. ඒ. ඩී. වීරසූරිය | අ.පො.ස.ප. (සා.පෙ.) | දොස්තර එච්. ඒ. ඩී. වීරසූරිය |

### උද්භිද විද්‍යාව

අනුමතියේ වලංගු කාලය 1972.1.1 සිට 1974.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | උසස් උද්භිද විද්‍යාව | එච්. ඩබ්ලිව්. පෙරේරා, කේ. සන්ගර් අයිසර්, සී. රාමනාදන් | අ.පො.ස.ප. (උසස් පෙළ) | විජයලක්ෂ්මී පොත්හල |

### පාළි—අතිරේක කියවීම් පොත

අනුමතියේ වලංගු කාලය 1971.3.28 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | පාළි පාඨ සංගහො | ජී. කේ. එජ්. වික්‍රමසේකර | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### පාළි භාෂාව

අනුමතියේ වලංගු කාලය 1973.1.1 සිට 1975.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 2. | පාළි පාඨ මංජරි (ද්විතිය භාගය) | පණ්ඩිත කහදමෝදර චන්ද්‍ර කිර්ති ශ්‍රී පියරතන ස්ථවිර | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### භූගෝල විද්‍යාව—අතිරේක පන්ති පොත්

අතිරේක කියවීම් :

අනුමතියේ වලංගු කාලය 1973.1.1 සිට 1975.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | මානුෂ භූගෝල විද්‍යාව | අනුර වී. දහනායක, සිරි පොන්නම් පෙරුම | අ.පො.ප. (උසස් පෙළ) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 2. | උසස් ප්‍රාදේශීය භූ. විද්‍යාව | නිව්ටන් කේ. ප්‍රනාන්දු | අ.පො.ස. (සා.පෙළ.) | එම |
| 3. | භූගෝල විද්‍යාව | ජී. තලහගම | 4 | එම |

අනුමතියේ වලංගු කාලය 1972.1.1 සිට 1974.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 4. | සමෝච්ච රේඛා සහ සිතියම් ඇඳීමේ අභ්‍යාස | ජේ. ඩී. බැප්ටිස්ට් | කණිෂ්ඨ හා අ.පො.ස. (සා.පෙ) | ශ්‍රී ලංකා ක්‍රිස්තියානි පොත් සමාගම |
| 5. | භූගෝල විද්‍යාව—1 (භෞතික පදනම) | එන්. වීරතුංග | අ.පො.ස. උසස් පෙළ | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | මූලික ලංකා–ලෝක හා භෞතික භූගෝල විද්‍යාව | එන්. වීරතුංග | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ඇම්. ගුණසේන සහ සමාගම |
| 2. | සිතියම් කියවීමේ අභ්‍යාස | ඇස්. ඇප්. ද සිල්වා | එම | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සහ සමාගම |

### ශාරීරික විද්‍යාව හා ස්වස්ථතාව

අනුමතියේ වලංගු කාලය 1973.1.1 සිට 1975.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1. | ශාරීරක විද්‍යා හා ස්වස්ථතාව | පී. බී. බාලසූරිය | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 2. | ජ්‍යෙෂ්ඨ කායික විද්‍යාව හා ස්වස්ථතාව | දොස්තර කේ. බී. එජ්. පියසීලි | අ.පො.ස.ප. (සා.පෙ.) | සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් |

| පන්ති පොතේ අංකය | පොතේ නම | කර්තෘ | පන්තිය | ප්‍රකාශකයෝ |
|---|---|---|---|---|
| | | **ආර්ථික විද්‍යාව** | | |
| | | **අනුමතියේ වලංගු කාලය 1972.1.1 සිට 1974.12.31 දක්වා** | | |
| 1. | ආර්ථික විද්‍යාව ... | ... ඇජ්. ඇම්. ජයසූරිය ... | — | ... සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| | | **රසායන විද්‍යාව** | | |
| | | **අනුමතියේ වලංගු කාලය 1973.1.1 සිට 1975.12.31 දක්වා** | | |
| 1. | පාඨශාලිය නූතන රසායන විද්‍යාව | ... ඇජ්. ඩබ්. ගොවාඩ් සහ කෙනත් හටන් පරිවර්තක හර්බට් වී. එස්. ගුණසේකර | අ.පො.ස. (සා.පෙ.) | ... සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| | | **කතෝලික ධර්මය** | | |
| | | **අනුමතියේ වලංගු කාලය 1973.1.1 සිට 1975.12.31 දක්වා** | | |
| 1. | නූතන කතෝලික සභාව | ... ජේ. ඇලෙක්ස් ප්‍රනාන්දු ... | — | ... සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

**1-577—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 73. 1. 5 | සිකුරාද | ... | 72.12.27 | බදාදා | දවල් 12.00 |
| | | 73. 1.12 | සිකුරාද | ... | 73. 1. 3 | බදාදා | දවල් 12.00 |
| | | 73. 1.19 | සිකුරාද | ... | 73. 1.10 | බදාදා | දවල් 12.00 |
| | | 73. 1.26 | සිකුරාද | ... | 73. 1.17 | බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි | ... | 73. 2. 2 | සිකුරාද | ... | 73. 1.24 | බදාදා | දවල් 12.00 |
| | | 73. 2. 9 | සිකුරාද | ... | 73. 1.31 | බදාදා | දවල් 12.00 |
| | | 73. 2.15 | බ්‍රහස්පතින්ද | ... | 73. 2. 7 | බදාදා | දවල් 12.00 |
| | | 73. 2.23 | සිකුරාද | ... | 73. 2.14 | බදාදා | දවල් 12.00 |
| මාර්තු | ... | 73. 3. 2 | සිකුරාද | ... | 73. 2.21 | බදාදා | දවල් 12.00 |
| | | 73. 3. 9 | සිකුරාද | ... | 73. 2.28 | බදාදා | දවල් 12.00 |
| | | 73. 3.16 | සිකුරාද | ... | 73. 3. 7 | බදාදා | දවල් 12.00 |
| | | 73. 3.23 | සිකුරාද | ... | 73. 3.14 | බදාදා | දවල් 12.00 |
| | | 73. 3.30 | සිකුරාද | ... | 73. 3.21 | බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 | සිකුරාද | ... | 73. 3.28 | බදාදා | දවල් 12.00 |
| | | 73. 4.11 | බදාදා | ... | 73. 4. 4 | බදාදා | දවල් 12.00 |
| | | 73. 4.19 | බ්‍රහස්පතින්ද | ... | 73. 4.11 | බදාදා | දවල් 12.00 |
| | | 73. 4.27 | සිකුරාද | ... | 73. 4.18 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.